**ශීර්ෂය 102 - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැකිය.

(ආ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ මෙම වාර්තාවෙන් ඉදිරිපත් නොකෙරේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවෙහි ඇතුළත් කාර්යාලීය පරිගණක, විද්‍යුත්, සන්නිවේදන හා ගෘහ භාණ්ඩඋපකරණ වලට අදාල වටිනාකම් හා ඒ පිළිබඳ තොරතුරු 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොතිබුණි. | අදාළ වත්කම් හඳුනාගෙන ඊට අදාළ වටිනාකම් ගිණුම්ගත කළ යුතු වීම. | අදාල ශේෂයන් හඳුනාගැනීමේ කටයුතු අවසන් කරමින් පවතින අතර ඒ හේතුවෙන් 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි එම වත්කම් හා ඊට අදාල වටිනාකම් ඇතුළත් නොකරන ලද බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය වියදම් ඒකක දක්වා ව්‍යාප්ත කිරීම සඳහා රු. මිලියන 500 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද සලසාගත් ප්‍රතිපාදනය 2018 දෙසැම්බර් මාසයේදී අවලංගු කර තිබුණි. | අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කල යුතු වීම. | 2018 වර්ෂය තුලදී මෙම කාර්යය, පද්ධති සංවර්ධන කටයුතු අවසන් නොවීම හේතුවෙන් එම වැය විෂයය අහෝසි කර ඊට අදාල ප්‍රතිපාදනය මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය වෙත පවරා දෙන ලද බව. |
| (ආ) | වැය විෂයයන් 15 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 645.95 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. | අපේක්ෂිත පරිදි වියදම් ඉදිරිපත් නොවීම මත ප්‍රතිපදාන ඉතිරි වූ බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වැය ශීර්ෂය යටතේ රාජ්‍ය ආයතන 04 ක් වෙත එකතුව රු. මිලියන 233 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන සලසා දී තිබුණද, ආයතන 01 කට ලබාදුන් මුළු ශුද්ධ ප්‍රතිපාදනයම හා ඉතිරි ආයතන 03 සඳහා ලබාදුන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 91 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | -එම- | නිරීක්ෂණ හා එකඟ වන බව. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව බැදීම් ඇති කර ගැනීමට ප්‍රථම අදාල වැය විෂයයන් තුල ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර නොගෙන වැය විෂයයන් 12 ක ඉතිරිය ඉක්මවා එකතුව රු.83,951,284 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන වලින් 2017 වර්ෂයේ බැරකම් වෙනුවෙන් ගෙවීම් කිරීමට සිදුවීම නිසා අදාල වැය විෂයන්හි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බව. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු වසරකට වැඩි ණය ශේෂවල එකතුව රු.924,255 ක් විය. | හිඟ ණය සම්බන්ධව කටයුතු සොයා බලා නොපමාව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වීම. | අයකර ගැනීමට හැකියාවක් නොමැති ණය මු.රෙ. 113 අනුව අත්හැර දැමීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇති බවත්, ඉතිරි ණය මුදල් අය කර ගැනීම සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් විදේශ ණය/ ආධාර යටතේ ව්‍යාපෘති 05 ක් සඳහා එකතුව රු.මිලියන 2,261.5 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එයින් ව්‍යාපෘති 03 ක කටයුතු ආරම්භ නොකිරීම හා ව්‍යාපෘති 02 ක කාර්යසාධනය මන්දගාමී වීම හේතුවෙන් එකතුව රු.මිලියන 1,041.16 ක් හෙවත් සියයට 46 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කල යුතුවීම. | නීතිමය හා ප්‍රායෝගික හේතුත්මත ව්‍යාපෘති අරමුණු ලඟා කර ගැනීම ප්‍රමාද වීම, ව්‍යාපෘති මෙහෙයුම් කටයුතු ආරම්භ වීමේ ප්‍රමාදය හා ව්‍යාපෘති ආරම්භ නොවීම නිසා ප්‍රතිපදාන ඉතිරි වූ බව. |

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මහා භාණ්ඩාගාර ගොඩනැඟිල්ලේ සවිකර ඇති විදුලි සෝපාන 04 ක් ගලවා ඉවත්කර නව විදුලි සෝපාන 04 ක් සවිකිරීමේ කොන්ත්‍රාත්තුව පුද්ගලික ආයතනයක් වෙත රු.21,005,625 ක මුදලකට ප්‍රදානය කර 2016 ඔක්තෝබර් 29 දින අත්තිකාරම් මුදල් ලෙස රු.4,663,250 ක් ලබාදී තිබුණි.සමාලෝචිත වර්ෂය අවසන් වනවිට මාස 26 ක් ගත වී තිබුණද, කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී තිබුණි. | ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්තුව කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුවීම. | මේ වන විට කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුමේ සඳහන් සියළු කොන්දේසි නොවෙනස් වන පරිදි නැවත කොන්ත්‍රාත්කරු වෙත ලබා දෙන ලද අත්තිකාරම් මුදලේ වටිනාකමට සමාන අත්තිකාරම් සුරක්ෂණයක් හා කාර්යසාධන සුරක්ෂණයක් කොන්ත්‍රාත්කරු වෙතින් ලබාගෙන ඇති බවත් මෙම ප්‍රසම්පාදන 2019 වසර තුලදී නිම කිරීමට නියමිතව ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ආ | 2018 අයවැය යෝජනා පිළිබඳ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීම සඳහා හා එම දැන්වීම් නිර්මාණය හා නිෂ්පාදනය සඳහා 2018 වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් එකතුව රු.73,892,963 ක් වැයකර තිබුණද ප්‍රචාරණ කාර්යයට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාගැනීම රජයේ ප්‍රසම්පාදන පරිපාටිය අනුව ක්‍රියාත්මක කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුව කටයුතු කල යුතු වීම. | විගණන නිරීක්ෂණ හා එකඟ වන බව. |
| (ඇ) | අමාත්‍යාංශය විසින් දෙවසරක මාධ්‍ය නිදහසේ වෙනස පිළිබඳ මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පුවත්පත් දැන්වීම් පළකිරීම, රූපවාහිනී දැන්වීම් පළකිරීම, සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවිවල දැන්වීම් ප්‍රචාරය කිරීම හා වැඩසටහන් නිෂ්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර, එකතුව රු.20,382,180 ක් වැයකර තිබුණි. | අමාත්‍යාංශයේ අරමුණුවලට අදාළ වන පරිදි හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුවීම. | විගණන නිරීක්ෂණ හා එකඟවන බව. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ ශේෂය රු.මිලියන 11,373.57 ක් ලෙස දක්වා තිබුණද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳව කේවල ශේෂ වටිනාකමේ ඇතුළත් උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොකෙරුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වත්කම් පිළිබඳ කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි කේවල ශේෂ උපලේඛන ඇතුළත් කිරීමට නොහැකි වූ බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 2015 සැප්තැම්බර් මස එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සාමාජික රටවල් වල එකඟතාවය ප්‍රකාරව වසර 2030 වනවිට සෑම සාමාජික රටක් විසින්ම ලඟාකර ගතයුතු අරමුණු හා ඉලක්ක ඇතුළත් තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත්ව අදාල සුදුසු ඉදිරි පියවර ගෙන තිබූ බව | අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධව අරමුණු හා ඉලක්ක හඳුනාගෙන සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නොතිබුණි. |

විගණනයේදී අනාවරණය නොවීය.

**5. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමස්ථ පුරප්පාඩු 77 ක් එනම් අනුමත සංඛ්‍යාවෙන් සියයට 19 ක් පුරප්පාඩුව පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 15 ක් විය. | පුරප්පාඩු පැවතීම අමාත්‍යාංශයේ රාජකාරී ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අහිතකර ලෙස බලපාන්නේ නම් කඩිනමින් සම්පූර්ණ කළ යුතුවීම. | මෙම පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර එවන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බවත්, ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කරන තෙක් වැඩ බැලීමේ පදනම මත රාජකාරී ආවරණය කිරීම සිදු කරන බවත් අමාත්‍යාංශයේ රාජකාරී කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීම සඳහා මෙම පුරප්පාඩු හැකි ඉක්මනින් සම්පූර්ණ කළ යුතුව ඇති බව. |